සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2020 ජූලි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2020-09-26
පෙරවරු
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ආදායම් ප්‍රකාශයේ මූලිකාංගයක් වන්නේ කුමක්ද?

(1) වත්කම්. (2) ස්කන්ධය. (3) ආදායම්. (4) වගකීම්.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය තෝරන්න:

(1) අදාල බව යනු මූල්‍ය තොරතුරක මූලික ගුණාත්මක ලක්ෂණයකි.
(2) ගනුදෙනු, ගිණුම්කරණ නිමැවුමක් ලෙස සැලකේ.
(3) ගිණුම්කරණයේ ප්‍රධානතම අරමුණ වන්නේ, සංවිධානයේ සේවකයන්ව ආරක්ෂා කිරීමයි.
(4) මූල්‍ය තොරතුරුවල කිසිදු සීමාවක් නොමැත.

**1.3** *"ව්‍යාපාරය හා අයිතිකරු එකිනෙකින් වෙන් වූ ස්වාධීන අස්තිත්ව දෙකක් සේ සලකා ගනුදෙනු හඳුනා ගනී."*

පහත සඳහන් ගිණුම්කරණ සංකල්ප අතුරින්, ඉහත සඳහන් ප්‍රකාශනය, පැහැදිලි කරන්නේ කුමන සංකල්පයෙන්ද?

(1) අස්තිත්ත්ව (Entity) සංකල්පය. (2) අඛණ්ඩ පැවැත්ම (Going Concern) සංකල්පය.
(3) සංගතතා (Consistency) සංකල්පය. (4) ආරක්ෂණ (Prudence) සංකල්පය.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, අස්තිත්වයක ඇල්මැති පාර්ශවයක් (stakeholder) වන්නේ කවුරුන්ද?

(1) සේවකයන්. (2) රජය.

(3) කළමනාකරුවන්. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.5** ව්‍යාපාරයක් විසින් එහි සේවකයෙකු වන **සුදත්** හට සේවක ණයක් මුදලින් ලබාදෙන ලදී. මෙම ගනුදෙනුව වාර්තා කරන නිවැරදි ද්විත්ව සටහන වන්නේ:

(1) මුදල් ගිණුම හර සහ සේවක ණය ගිණුම බැර. (2) මුදල් ගිණුම හර සහ වැටුප් ගිණුම බැර.

(3) වැටුප් ගිණුම හර සහ සේවක ණය ගිණුම බැර. (4) සේවක ණය ගිණුම හර සහ මුදල් ගිණුම බැර.

**1.6** කේවලස්වාමි (තනි පුද්ගල) ව්‍යාපාරයක් වන **රුවන් ට්‍රේඩර්ස්** හි පොත්වලින්, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

| | **රු.** |
|---|---|
| 2020 මාර්තු 31 දිනට මුළු වත්කම් | 1,550,000 |
| 2020 මාර්තු 31 දිනට වගකීම් | 750,000 |
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | 280,000 |
| වර්ෂය තුළ සිදුකළ ගැනිලි | 150,000 |

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ලාභය වන්නේ:

(1) රු.670,000/- කි. (2) රු.800,000/- කි. (3) රු.370,000/- කි. (4) රු.930,000/- කි.

**1.7** කේවලස්වාමි ව්‍යාපාරයක අයිතිකරු විසින් තම පෞද්ගලික මෝටර් වැන් රථය තම ව්‍යාපාරයට පැවරීම තුළින් ගිණුම්කරණ සමීකරණයට ඇතිකරනු ලබන නිවැරදි බලපෑම, පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න:

(1) ස්කන්ධය (හිමිකම) වැඩිවීම සහ වත්කම් අඩුවීම. (2) වත්කම් වැඩිවීම සහ ස්කන්ධය (හිමිකම) අඩුවීම.

(3) වගකීම් වැඩිවීම සහ ස්කන්ධය (හිමිකම) අඩුවීම. (4) වත්කම් වැඩිවීම සහ ස්කන්ධය (හිමිකම) වැඩිවීම.

**1.8** ගබඩාවට භාණ්ඩ ලැබීම වාර්තා කිරීම සඳහා උපයෝගී කරගන්නා ලියවිල්ල වන්නේ:

(1) මිලදී ගැනුම් ඇණවුමයි [Purchase Order (PO)].

(2) මිලදී ගැනීමේ අධියාචනා පත්‍රයයි [Purchase Requisition Note (PRN)].

(3) භාණ්ඩ ලැබීමේ පත්‍රිකාවයි [Goods Received Note (GRN)].

(4) ද්‍රව්‍ය අධියාචනා පත්‍රයයි [Material Requisition Note (MRN)].

**1.9** "COVID-19" වසංගතය හේතුවෙන්, ලොව පුරා කාබන් මට්ටමේ (carbon foot print level) හෝ කාබන් ඩයොක්සයිඩ් විමෝචන මට්ටමේ අඩුවීමක් සිදුව ඇත. කාබන් මට්ටම යන සංකල්පය PESTEL විශ්ලේෂණය තුළ අන්තර්ගත වන්නේ:

(1) තාක්ෂණික සාධකයක් ලෙසයි. (2) පාරිසරික සාධකයක් ලෙසයි.

(3) ආර්ථික සාධකයක් ලෙසයි. (4) සාමාජීය සාධකයක් ලෙසයි.

**1.10**

| වත්කම් | = | ස්කන්ධය (හිමිකම) | + | වගකීම් |
|---|---|---|---|---|
| 200,000 | = | 200,000 | + | - |

ඉහත සඳහන් ගිණුම්කරණ සමීකරණය සඳහා වඩාත් නිවැරදි ගනුදෙනුව වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) අයිතිකරු විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු.200,000/- ක් වටිනා භාණ්ඩ ලබා ගැනීම.

(2) රු.200,000/- ක් වූ ව්‍යාපාරයේ විදුලි බිල්පත අයිතිකරු විසින් ගෙවා තිබීම.

(3) අයිතිකරු විසින් රු.200,000/- ක අමතර මුදලක් ව්‍යාපාරයට යෙදවීම.

(4) ණය පදනම මත නැවත විකිණීම සඳහා රු.200,000/- ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීම.

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** වගකීමක් යනු අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආර්ථික සම්පත් හුවමාරු කිරීම සඳහා අස්තිත්වයට ඇති වර්තමාන බැඳීමකි.

**1.12** ප්‍රමාණාත්මක බවේ සංකල්පයට අනුව තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගය මත වාර්තා කරනු ලබයි.

**1.13** ව්‍යාපාරයක මුළු වත්කම්වල වටිනාකමෙන් මුළු වගකීම් වටිනාකම අඩුකිරීම මඟින් එහි ස්කන්ධයේ (හිමිකමෙහි) වටිනාකම ගණනය කළ හැකිය.

**1.14** උපචිත සංකල්පයට අනුව, කිසියම් ගිණුම්කරණ කාලපරිච්ඡේදයකට අදාළ අයභාරය මුදලින් ලැබුණේද නැද්ද යන්න නොසලකා හඳුනා ගනී.

**1.15** බැංකු සැසඳුම් ප්‍රකාශනය යනු ව්‍යාපාර අස්තිත්වයේ බැංකුව (bank) විසින් පිළියෙළ කරනු ලබන ප්‍රකාශනයකි.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** **නිමලසිරි හාඩ්වෙයාර්** විසින් 2018 අප්‍රේල් 01 දින රු.400,000/- කට යන්ත්‍රයක් මිලට ගන්නා ලදි. ආයතනයේ ප්‍රතිපත්තිය වනුයේ හීනවන ශේෂ ක්‍රමය භාවිත කර යන්ත්‍ර ක්ෂය කිරීමයි.

අදාළ ක්ෂය අනුපාතිකය වර්ෂයකට 25% ක් වන්නේ නම්, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයකරනු ලබන ක්ෂය වියදම ගණනය කරන්න.

**1.17** "සංගතතා (Consistency) සංකල්පය" කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.18** පොදු ජර්නලය තුළ වාර්තා කරනු ලබන ගනුදෙනු වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

**1.19** ජංගම වත්කම් (current assets) සඳහා උදාහරණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.20** පහත සඳහන් තොරතුරු **වතුර ට්‍රේඩර්ස් හි** පොත්වලින් 2020 මාර්තු මාසයට අදාලව උපුටාගෙන ඇත:

| | **රු.** |
|---|---:|
| 2020 මාර්තු 01 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය | 875,000 |
| මාර්තු මාසය සඳහා මිලදී ගැනුම් ජර්නලයේ එකතුව | 2,350,000 |
| මාර්තු මාසය සඳහා විකුණුම් ජර්නලයේ එකතුව | 3,450,000 |
| මාර්තු මාසය සඳහා ආපසු යැවුම් ජර්නලයේ එකතුව | 575,000 |
| මාර්තු මාසය තුළ ණයහිමියන්ට සිදුකළ ගෙවීම් | 1,450,000 |

ඉහත සඳහන් තොරතුරුවලට අනුව,

2020 මාර්තු 31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය ගණනය කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

**සමනල ස්ටෝර්ස්** යනු, **සමනල** ට අයත් තේවලස්වාමි ව්‍යාපාරයකි. 2020 මාර්තු 31 දිනට **සමනල ස්ටෝර්ස්** හි ශේෂ පිරික්සුම සමාන නොවූ අතර, එහි වෙනස වූ රු.49,500/-, අවිනිශ්චිත ගිණුමකට හර කරන ලදී. ඉන් අනතුරුව කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද අතර, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන අනුව වාර්තා කළ ශුද්ධ ලාභය රු.1,350,000/- ක් විය.

පහත සඳහන් වැරදි පසුව හඳුනාගන්නා ලදි:

(1) 2020 මාර්තු 31 දින රු.95,000/- ක පිරිවැයකට ණය පදනම මත මිලට ගන්නා ලද පරිගණකයක්, පරිගණක ගිණුමෙහි රු.9,500/- ක් ලෙස හරකර තිබුණි. කෙසේවෙතත්, බැර සටහන අදාල ණයහිමි ගිණුමෙහි නිවැරදිව සටහන් කර තිබුණි.

(2) රු.76,000/- ක අත්පිට මුදලට ගැනුම්, මුදල් පොතට නිවැරදිව බැර කර තිබුණි. කෙසේවෙතත්, ඊට අදාල හර සටහන වාර්තාකර නොතිබුණි.

(3) 2020 මාර්තු 31 දින දරණ ලද රු.66,000/- ක් වූ කාර්යාල නඩත්තු වියදම, මුදල් පොතෙහි නිවැරදිව වාර්තාකර තිබුණු නමුත් එය කාර්යාල උපකරණ ගිණුමට හර කර තිබුණි.

(4) රු.112,000/- ක මෝටර් රථ ක්ෂයවීම් අදාල ක්ෂය වියදම් ගිණුමට දෙවරක් හර කර තිබූ අතර, ඊට අදාල බැර සටහන නියමිත ලෙජර් ගිණුමෙහි නිවැරදිව සඳහන් කර තිබුණි.

(5) විකුණුම් ජර්නලය රු.225,000/- ක් අඩුවෙන් එකතුකර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

(b) අවිනිශ්චිත ගිණුම **පිළියෙල කරන්න.** (ලකුණු 02)

(c) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගලපන ලද / නිවැරදි කරන ලද ශුද්ධ ලාභය **ගණනය කරන්න**.

(ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

2019 අප්‍රේල් 01 දින **නානයක්කාර** විසින් කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ව්‍යාපාරයට ඔහු විසින් මෝටර් ලොරියක් යෙදවීමට අමතරව, ප්‍රාග්ධනය ලෙස රු.1,500,000/- ක මුදලක් එදිනම බැංකු ගිණුමක් ආරම්භ කර එහි තැන්පත් කරන ලදී.

ව්‍යාපාරයේ පොදු ජර්නලයෙන් පහත සඳහන් ජර්නල් සටහන උපුටා ගන්නා ලදී:

*(රු.)*

| | **හර** | **බැර** |
|---|---|---|
| මෝටර් ලොරිය | 1,740,000 | |
| ප්‍රාග්ධන ගිණුම | | 1,740,000 |
| **2019 අප්‍රේල් 01 දින අයිතිකරු විසින් මෝටර් රථයක් ව්‍යාපාරයට යෙදවීම** | **1,740,000** | **1,740,000** |

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් පාලන ගිණුම (මුදල් පොත) පහත පරිදි විය:

| | **රු.** | | **රු.** |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 1,500,000 | ණයහිමියන්ට ගෙවීම් | 3,850,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 3,200,000 | බදු කුලී | 864,000 |
| අත්පිට විකුණුම් | 4,118,000 | විදුලිය හා ජලය | 258,000 |
| | | වේතන හා වැටුප් | 1,810,000 |
| | | ශේෂය ප/ගෙ | 2,036,000 |
| | **8,818,000** | | **8,818,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දිනට ගිණුම් පොත්වල පහත සඳහන් ශේෂයන් පැවතුණි:

| | **රු.** |
|---|---|
| වෙළෙඳ ණයගැතියන් | 975,000 |
| වෙළෙඳ ණයහිමියන් | 1,240,000 |
| ගෙවිය යුතු විදුලිය හා ජලය | 15,000 |

(2) මෝටර් ලොරිය, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 20% බැගින් ක්ෂය කරනු ලබයි.

(3) 2020 මැයි 31 දිනෙන් අවසන් මාස 12 ක කාලය සඳහා වන බදු කුලිය 2019 ජුනි 01 දින ගෙවන ලදී.

(4) 2020 මාර්තු 31 දිනට කිසිදු තොගයක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 මාර්තු 31 දිනට **නානයක්කාරගේ ව්‍යාපාරයේ** ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

පාසැල් බෑග් නිෂ්පාදන සමාගමක් වන **BMI** හි, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට පහත සඳහන් තොරතුරු අදාල වේ:

| **විස්තරය** | **රු.** |
|---|---|
| 2019 අප්‍රේල් 01 දිනට තොගය: | |
| අමු ද්‍රව්‍ය | 810,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 445,000 |
| අමුද්‍රව්‍ය මිලදී ගැනුම් | 2,850,000 |
| විදුලිය වියදම් | 275,000 |
| ජල වියදම් | 200,000 |
| කර්මාන්තශාලා බදු කුලිය | 225,000 |
| රක්ෂණ වියදම් | 300,000 |
| සෘජු වැටුප් | 1,270,000 |
| කර්මාන්තශාලා යන්ත්‍ර සඳහා වන ඉන්ධන | 130,000 |
| කර්මාන්තශාලා කළමනාකරුගේ වේතනය | 860,000 |
| කර්මාන්තශාලා යන්ත්‍ර මත ක්ෂයවීම් | 270,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දිනට තොගය පහත පරිදි ගණනය කර ඇත:

| **විස්තරය** | **පිරිවැය (රු.)** |
|---|---|
| අමුද්‍රව්‍ය | 900,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට ගණනය කළ) | 690,000 |

(2) පහත සඳහන් වියදම් කර්මාන්තශාලාව සහ කාර්යාලය අතර පහත පරිදි බෙදා වෙන්කළ යුතුය:

| **වියදම්** | **කම්හල** | **කාර්යාලය** |
|---|---|---|
| විදුලිය | 80% | 20% |
| ජලය | 75% | 25% |
| රක්ෂණය | 90% | 10% |

(3) නිමකරන ලද පාසැල් බෑග්, පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් ද සහිතව විකුණුම් අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **BMI** හි නිෂ්පාදන ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(A) කේවලස්වාමි ව්‍යාපාරයක් වන **සැම් ට්‍රේඩර්ස්** හි පොත්වලින් 2020 මාර්තු මාසය සඳහා වන පහත සඳහන් ගනුදෙනු උපුටාගෙන ඇත:

| **දිනය** | **ගනුදෙනුව** |
|---|---|
| 2020.03.02 | නැවත විකිණීම සඳහා රු.450,000/- ක් වටිනා භාණ්ඩ ණය පදනම මත මිලදී ගන්නා ලදී. |
| 2020.03.05 | රු.390,000/- ක් පිරිවැය වූ තොග රු.445,000/- ක මුදලකට ණයට විකුණන ලදී. |
| 2020.03.10 | **සැම්** විසින් රු.38,500/- ක් පිරිවැය වූ භාණ්ඩ තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගන්නා ලදී. |
| 2020.03.15 | සේවක වේතන වශයෙන් රු.25,000/- ක් ගෙවන ලදී. |
| 2020.03.15 | බැංකුවේ ස්ථාවර තැන්පතුවක රු.200,000/- ක මුදලක් ආයෝජනය කරන ලදී. |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සටහන් කරන්න**.

*[තොග + ණයගැතියෝ + ස්ථාවර තැන්පතුව + මුදල් = ස්කන්ධය (හිමිකම) + වගකීම් ]* (ලකුණු 05)

(B) **රණසිංහ සහ සමාගමේ** 2020 මාර්තු 31 දිනට, බැංකු ප්‍රකාශනය අනුව බැංකු ශේෂය, එහි මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) වාසිදායක (හර) ශේෂය වන රු.155,000/- සමඟ එකඟ නොවීය.

පහත සඳහන් හේතු පසුව හඳුනාගන්නා ලදි:

(1) ස්ථාවර නියෝගයක් අනුව බැංකුව විසින් බැංකු ගිණුමෙන් රු.75,000/- ක මුදලක් අඩු කරගෙන තිබුණ ද එය මුදල් පොතෙහි වාර්තාකර නොතිබුණි.

(2) ගනුදෙනුකරුවෙකු විසින් බැංකුව වෙත සෘජුවම තැන්පත් කළ රු.30,000/- ක් මුදල් පොතෙහි වාර්තාකර නොතිබුණි.

(3) **රණසිංහ සහ සමාගම** විසින් 2020 මාර්තු 29 දින රු.195,000/- ක් වටිනා චෙක්පතක් නිකුත්කර තිබුණ ද, එය 2020 මාර්තු 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(4) **රණසිංහ සහ සමාගම** විසින් 2020 මාර්තු 30 දින රු.65,000/- ක් වටිනා චෙක්පතක් බැංකුවෙහි තැන්පත් කර තිබූ නමුත් එය 2020 මාර්තු 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

(5) රු.1,500/- ක බැංකු ගාස්තු මුදල් පොතෙහි වාර්තාකර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) **පිළියෙළ කරන්න**. (ලකුණු 03)

(b) 2020 මාර්තු 31 දිනට බැංකු ප්‍රකාශනයෙහි පෙන්නුම්කරන ශේෂය **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# <u>C කොටස</u>

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**ගෝල්ඩන් ටෙක්** යනු **කරුණාතිලකට** අයත් කේවලස්වාමි ව්‍යාපාරයකි. එහි 2020 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි විය:

**ගෝල්ඩන් ටෙක්**

**2020 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---:|---:|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම | 3,000 | |
| ගොඩනැගිලි | 3,500 | |
| මෝටර් වාහනය | 2,700 | |
| 2019 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 620 |
| මෝටර් වාහනය | | 440 |
| 2019 අප්‍රේල් 01 දිනට තොගය | 6,200 | |
| මිලදී ගැනුම් | 18,250 | |
| විකුණුම් | | 33,900 |
| 2019 අප්‍රේල් 01 දිනට අඩමාණ ණය සඳහා වෙන්කිරීම | | 200 |
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 9,450 |
| බැංකු ණය | | 2,500 |
| විදුලිය වියදම් | 3,200 | |
| ජල වියදම් | 450 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 3,850 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 2,600 |
| වැටුප් සහ වේතන | 5,550 | |
| ප්‍රවාහන වියදම් | 290 | |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 1,100 | |
| රක්ෂණ වියදම් | 1,200 | |
| ප්‍රචාරණ වියදම් | 100 | |
| ගැනිලි | 320 | |
| | **49,710** | **49,710** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දිනට අවසාන තොගය, පිරිවැයට රු.3,800,000/- කට අගය කරන ලදී.

(2) රු.600,000/- ක් පිරිවැය වූ ලී බඩු 2019 ඔක්තෝම්බර් 01 දින **සීමාසහිත X සමාගමෙන්** ණය පදනම මත මිලට ගන්නා ලදී. මෙය ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂයකට 5% |
| මෝටර් වාහන | : | වර්ෂයකට 20% |
| ලී බඩු | : | වර්ෂයකට 25% |

(3) පහත සඳහන් වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයන් බොල්ණය ලෙස ලියා හැරීමට කළමනාකරණය තීරණය කළේය:

| | **රු.** |
|---|---|
| **ප්‍රසන්න** | 150,000 |
| **සමන්ත ඇසෝසියේට්ස්** | 200,000 |
| **DKW සහ සමාගම** | 500,000 |
| | **850,000** |

මෙයට අමතරව, ඉහත ලියාහැරීම් සිදුකිරීමෙන් පසු 2020 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 10% ක පොදු ප්‍රතිපාදනයක් අඩමාණ ණය සඳහා සිදුකළ යුතුව ඇත.

(4) 2020 මාර්තු මාසයට අදාලව ගෙවිය යුතු බිල් පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| විදුලිය | : | රු.350, 000/- |
| ජලය | : | රු.80, 000/- |

(5) 12% ක වාර්ෂික පොලී අනුපාතිකයකට යටත්ව රු.2,500,000/- ක බැංකු ණයමුදලක් 2020 මාර්තු 01 දින ලබාගන්නා ලදී. පළමු වාරිකය 2020 අප්‍රේල් 01 දින ගෙවිය යුතු වේ. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ණය පොලිය පොත්වල ගිණුම්ගත කර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

## <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |